
# Project 55
# 55 වන ව්‍යාපෘතිය

DP EDUCATION

Coding School





LIVEWORKSHEETS

බුදු රැස් වළල්ලක් නිර්මාණය කරමු.

❖ මේ සඳහා මුලින්ම artist ව ස්ථානගත කරමු. "Jump to over down" block එක මඟින් X=0 හා Y=0 වන පරිදි ස්ථාන ගත කරන්න.




❖ මුලින්ම මුළු තිරයම කළු පැහැති කර ගනිමු.ඒ සඳහා මුලින්ම "set width" block එක මඟින් brush එකේ ප්‍රමාණය 45 ට සකස් කරන්න.ඉන්පසු "move forward" block එක මඟින් ඉදිරියට 375 pixels ක් ගමන් කර අංශක 90 කින් දකුණට හැරී නැවතත් ඉදිරියට 20 pixels ක් ගමන් කර අංශක 90 කින් වමට හැරී ආපස්සට 375 pixels ක් ගමන් කල යුතු වේ.එම ක්‍රියාවලිය 20 වතාවක් සිදු විමට "repeat do" block එකද භාවිතයට ගන්න.





❖ "Jump to over down" block එක මඟින් X=200 හා Y=200 වන පරිදි artist ස්ථාන ගත කර brush එකේ ප්‍රමාණය 4 ට සකසන්න.




❖ බුදු රැස් වළල්ලේ අවසාන වළල්ල නිර්මාණය කරගැනීම සඳහා තැඹිළි පැහැති වර්ණය තෝරාගන්න. ඒ සඳහා "set color" block එක භාවිතා කරන්න.




❖ තැඹිළි පැහැති රැස් වළල්ල නිර්මාණය කිරිම සඳහා artist ව "Jump to position" block එක මගින් තිරයේ මැදට ගනිමු. මේ සඳහා "middle center" යන අගය භාවිතා කර move forward block එක මඟින් 180 pixels ක් ඉදිරියට ගමන් කර අංශක 1 කින් වමට හැරිය යුතුය. මෙම පියවරයන් නැවත නැවත 360 වතාවක් ඇඳීමෙන් වෘත්තයක් ඇඳගත හැකි වේ. පියවර කිහිපයක් නැවත නැවත සිදුවන නිසා ඒවා for loop එකක් තුළට දැමීම වඩා පහසු වේ.





❖ ඉන්පසු රැස් වළල්ල සුදු වර්ණයෙන් නිර්මාණය කිරිම සඳහා ඉහත පරිදිම "set color" block එක භාවිතා කරන්න.





.

LIVEWORKSHEETS


- සුදු පැහැති රැස් වළල්ල නිර්මාණය කිරීම සඳහා artist ව "Jump to position" block එක මගින් තිරයේ මැදට ගනිමු. මේ සඳහා "middle center" යන අගය භාවිතා කර move forward block එක මගින් 155 pixels ක් ඉදිරියට ගමන් කර අංශක 1 කින් වමට හැරිය යුතුය. මෙම පියවරයන් නැවත නැවත 360 වතාවක් ඇඳීමෙන් වෘත්තයක් ඇඳගත හැකි වේ.





- රතු වර්ණය සහිත රැස් වළල්ල නිර්මාණය කිරීම සඳහා ඉහත ආකාරයටම artist ව තිරයේ මැදට ගනිමු.ඉන්පසු 130 pixels ක් ඉදිරියට ගමන් කර අංශක 1 කින් වමට හැරිය යුතුය. for loop භාවිතයෙන් රැස් වළල්ලේ රතු පැහැති වෘත්තය සම්පූර්ණ කරන්න.




- කහ පැහැති රැස් වළල්ල නිර්මාණය කිරීම සඳහා artist ව "Jump to position" block එක මගින් තිරයේ මැදට ගනිමු. මේ සඳහා "middle center" යන අගය භාවිතා කර move forward block එක මගින් 105 pixels ක් ඉදි රියට ගමන් කර අංශක 1 කින් වමට හැරිය යුතුය. මෙම පියවරයන් නැවත නැවත 360 වතාවක් ඇඳීමෙන් කහ පැහැති රැස් වළල්ල නිර්මාණය කර ගත හැකිය.





- නිල් පැහැති රැස් වළල්ල නිර්මාණය කිරීම සඳහා artist ව "Jump to position" block එක මගින් තිරයේ මැදට ස්ථාන ගත කිරීම සඳහා "middle center" යන අගය භාවිතා කර move forward block එක මගින් 80 pixels ක් ඉදිරියට ගමන් කර අංශක 1 කින් වමට හැරිය යුතුය. මෙම පියවරයන් නැවත නැවත 360 වතාවක් ඇඳීමෙන් නිල් පැහැති රැස් වළල්ල නිර්මාණය කර ගත හැකිය.




LIVEWORKSHEETS

- artist ව “Jump to position” block එක මඟින් තිරයේ ඉහළ වම් කෙළවරට ගනිමු. මේ සඳහා “top left” යන අගය භාවිතා කරන්න.




LIVEWORKSHEETS